27686 (5)

OL/2024(2025)/64/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**64 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | | |
|---|---|---|
| දෙවන බස - සිංහල I, II<br>இரண்டாம் மொழி - சிங்களம் I, II<br>Second Language - Sinhala I, II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

**Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.**

## දෙවන බස - සිංහල I     இரண்டாம் மொழி - சிங்களம் I     Second Language - Sinhala I

උපදෙස්:
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න.
- ※ ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- ※ එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

அறிவுறுத்தல்கள்:
- ※ எல்லா வினாக்களுக்கும் விடை எழுதுக.
- ※ **1** தொடக்கம் **40** வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும். (1), (2), (3), (4) என எண்ணிடப்பட்ட விடைகளில் சரியான அல்லது மிகப் பொருத்தமான விடையைத் தெரிவுசெய்க.
- ※ உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் எண்ணை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (X) இடுக.
- ※ அவ்விடைத்தாளின் மறுபக்கத்தில் தரப்பட்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்து, பின்பற்றுக.

**Instructions:**
- ※ *Answer **all** questions.*
- ※ *In each of the questions from **1 to 40**, pick one of the alternatives* (1), (2), (3), (4) *which you consider is **correct or most appropriate.***
- ※ ***Mark a cross*** (X) ***on the number corresponding to your choice in the answer sheet provided.***
- ※ *Further instructions are given on the back of the answer sheet. Follow them carefully.*

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල, **තද කළු අකුරෙන්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.

**1** தொடக்கம் **5** வரையுள்ள வினாக்களில் தடித்த எழுத்தில் தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவுசெய்க.

Select the most suitable pair of words for the word printed in **bold letters** in questions from No. **1** to **5**.

**1.** අපේ බස් එක දැම්ම **එන්නැද්ද** ?
(1) එන්න නැද්ද  (2) එන්නෙ නැද්ද  (3) එන්නැ නැද්ද  (4) එන් ඇද්ද

**2.** නංගි මම පාඩම් කරේ නෑ කියල අම්මට **කියන්නෙපා.**
(1) කියන් එපා  (2) කියන්නෙ එපා  (3) කියන්න එපා  (4) කියන් නෙපා

[ 2 වැනි පිටුව බලන්න / பக். 2 ஐப் பார்க்க / *see page two*

3. මෙදා පාර මම කොහොමහරි දෙවන බස විෂයට විශිෂ්ට සාමර්ථ්‍යයක් **ගන්නෝන**.
(1) ගන්න ඕන්න (2) ගන්න ඕන (3) ගන්නෝ ඕන (4) ගන්නේ ඕන

4. ඔයා සඳුදා එනකොට **සල්ලිත්තරන්** එන්න.
(1) සල්ලි අරන් (2) සල්ලි තරන් (3) සල්ලිත් අරන් (4) සල්ලිත් රන්

5. සරෝජා, ඔයා **මල්ලිත්තෙක්ක** බයිසිකලෙන් කඩේට එන්න.
(1) මල්ලි එක්ක (2) මල්ලි තෙක්ක (3) මල්ලිත් තෙක්ක (4) මල්ලිත් එක්ක

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් **නිවැරදි උච්චාරණය** සහිත උත්තරය තෝරන්න.
**6** தொடக்கம் **10** வரையான வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் **சரியான உச்சரிப்பைத்** தரும் விடையைத் தெரிவுசெய்க.
Select the answer with **correct pronunciation** from the words given in questions from No. **6** to **10**.

6. (1) පතික වේදිකා (2) පදික වේදිකා (3) පදිග වේදිබා (4) පධික වේධිගා
7. (1) ප්‍රතාන නගර (2) ප්‍රතාන නකර (3) ප්‍රධාන නගර (4) ප්‍රධාන නකර
8. (1) ඉදුල් වතුර (2) ඉතුල් වතුර (3) ඉඳුල් වතුර (4) ඉකුල් වතුර
9. (1) බානීය ජලය (2) බාදීය ජලය (3) පානීය ඡලය (4) පානීය ජලය
10. (1) මක දෙපස (2) මග දෙබස (3) මක දෙබස (4) මග දෙපස

- අංක **11** සිට **14** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
**11** தொடக்கம் **14** வரையான ஒவ்வொரு கூற்றுக்கும் **மிகப்பொருத்தமான** வினாவைத் தெரிவுசெய்க.
Select the **most appropriate** question for each statement given from No. **11** to **14**.

11. අර පෙනෙන්නේ නෙළුම් නිවාසයයි.
(1) අර පෙනෙන්නේ කුමක් ද? (2) අරක පෙනෙන්නේ කොහේ ද?
(3) අරක පෙනෙන්නේ ඇයි? (4) නෙළුම් නිවාසය පෙනෙන්නේ කොහෙන් ද?

12. මට අලුත් පාසලට යන්න ලැබුණේ විභාගය සමත් වූ නිසා
(1) ඔයාට අලුත් පාසලට යන්න ලැබුණේ කුමක් ද? (2) ඔයාට අලුත් පාසලට යන්න ලැබුණේ කවද්ද?
(3) ඔයාට අලුත් පාසලට යන්න ලැබුණේ කීයට ද? (4) ඔයාට අලුත් පාසලට යන්න ලැබුණේ කොහොම ද?

13. පරිගණක පාඨමාලාව පටන් ගන්නේ ජනවාරි මාසෙ පහළොස් වෙනිදා
(1) පරිගණක පාඨමාලාව පටන් ගන්නේ ඇයි?
(2) පරිගණක පාඨමාලාව පටන් ගන්නේ මොකට ද?
(3) පරිගණක පාඨමාලාව පටන් ගන්නේ කවද්ද?
(4) පරිගණක පාඨමාලාව පටන් ගන්නේ කොහේ ද?

14. භාෂා කඳවුර තියෙන්නේ නාවලපිටිය ගනේෂ් මහා විද්‍යාලයේ ය.
(1) භාෂා කඳවුර පැවැත් වෙන්නේ ඇයි? (2) භාෂා කඳවුර පැවැත් වෙන්නේ කවද්ද?
(3) භාෂා කඳවුර පැවැත් වෙන්නේ කීයට ද? (4) භාෂා කඳවුර පැවැත් වෙන්නේ කොහේ ද?

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **නිවැරදි ව අකුරු** යෙදී ඇති උත්තරය තෝරන්න.
**15** தொடக்கம் **17** வரையான வினாக்களில் **சரியான எழுத்துக்கூட்டலைக்** கொண்ட சொல்லைத் தெரிவுசெய்க.
Select the answer with **correct spellings** in questions from No. **15** to **17**.

15. (1) අවතානයෙන් (2) අවදානයෙන් (3) අවධානයෙන් (4) අවධාණයෙන්
16. (1) සෞන්දර්යය (2) සෞන්ධර්යය (3) සෞන්දර්‍ය්‍යය (4) සෞන්ධර්‍ය්‍යය
17. (1) සාකච්චාව (2) සාකච්ඡාව (3) සාගච්ඡාව (4) සාගච්චාව

- අංක **18** සිට **20** තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන** පදය තෝරන්න.
**18** தொடக்கம் **20** வரையான வினாக்களில் **பொருத்தமற்ற** சொல்லைத் தெரிவுசெய்க.
Select the **inappropriate** word in questions from No. **18** to **20**.

18. (1) උමං මාර්ග (2) මාර්ග සංඥා (3) මාර්ග නීති (4) උපාය මාර්ග
19. (1) පොකුරු (2) කරල් (3) කිනිති (4) ඉන්න
20. (1) ආස්මී (2) කෙසෙල් (3) කොකිස් (4) අලුවා

[ 3 වැනි පිටුව බලන්න / பக். 3 ஐப் பார்க்க / *see page three*

- අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
**21** தொடக்கம் **23** வரையான வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **ஒத்தகருத்தைத்** தரும் சொல்லைத் தெரிவுசெய்க.
Select the **synonym** for the word given at the beginning in questions from No. **21** to **23**.

**21.** රාත්‍රිය : (1) දවාල (2) පාන්දර (3) රැය (4) සවස

**22.** කෑම : (1) ආහාර (2) බඩගින්න (3) භාජනය (4) පෝෂණය

**23.** දුක : (1) කෝපය (2) කනගාටුව (3) උවදුර (4) සන්තෝෂය

- අංක **24** සහ **25** ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
**24, 25** ஆகிய வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு எதிர்க்கருத்தைத் தரும் சொல்லைத் தெரிவுசெய்க.
Select the **antonym** for the word given at the beginning in questions No. **24** and **25**.

**24.** ආලෝකය : (1) එළිය (2) දීප්තිය (3) අඳුර (4) ප්‍රභාව

**25.** ඇත්ත : (1) සත්‍ය (2) සැබෑ (3) නැත්ත (4) නැතුව

- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන අදහස** දැක්වෙන වරණය තෝරන්න.
**26** தொடக்கம் **28** வரையான ஒவ்வொரு வினாவிலும் தரப்பட்டுள்ள படத்துக்கு **மிகப் பொருத்தமான கருத்தைத்** தரும் விடையைத் தெரிவுசெய்க.
Select the option that gives the **most suitable idea** for the picture given in each question from No. **26** to **28**.

**26.**



(1) ජලය බීමට පමණයි
(2) ජලය අපතේ යවන්න එපා
(3) ජල කාන්දුවක් පවතියි
(4) ජලය රැස් කරන ස්ථානය

**27.**



(1) කසළ බඳුනට දමන්න
(2) කසළ බඳුනට දමන්න එපා
(3) වතුර දැමීම නුසුදුසු ය
(4) පොහොර දමන්න එපා

**28.**



(1) ගිනි නිවන ස්ථානය
(2) මෙතනින් ගිනි තියන්න
(3) ගිනි දැල්වීම තහනම්
(4) ගින්න නිවා දමන්න එපා

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට **ගැළපෙන උත්තරය** තෝරන්න.
**29, 30** ஆகிய வினாக்களுக்குப் பொருத்தமான விடையைத் தெரிவுசெய்க.
Select the **suitable answer** for questions No. **29** and **30**.

**29.** අනුන්ගෙන් ඉල්ලා ගෙන ජීවත්වන්නා
(1) සංචාරකයා (2) දඩයක්කරුවා (3) යාචකයා (4) පදිකයා

**30.** ස්වාමීන් වහන්සේලා ආහාර අනුභව කරනවා
(1) අමදිනවා (2) සැතපෙනවා (3) වඩිනවා (4) වළඳනවා

[ 4 වැනි පිටුව බලන්න / பக். 4 ஐப் பார்க்க / *see page four*

- අංක **31** සහ **32** ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස නිවැරදි ව සම්බන්ධ කර **ලියා ඇති වාක්‍යය** තෝරන්න.
**31, 32** ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் வீதம் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் ஒரு வாக்கியமாக சரியாக இணைத்து **எழுதப்பட்டுள்ள வாக்கியத்தைத்** தெரிவுசெய்க.
In questions No. **31** and **32,** two sentences each are given. Select the **sentence** that correctly combines the two sentences.

**31.** දුප්පත්කම නැති කරනවා. ලස්සන ජීවිතයක් ගොඩනගනවා.
(1) දුප්පත්කම නැති කරමින් ලස්සන ජීවිතයක් ගොඩනගනවා.
(2) දුප්පත්කම නැති කිරීමට ලස්සන ජීවිතයක් ගොඩනගනවා.
(3) දුප්පත්කම නැති කිරීම සඳහා ලස්සන ජීවිතයක් ගොඩනගනවා.
(4) දුප්පත්කම නැති කිරීම පිණිස ලස්සන ජීවිතයක් ගොඩනගනවා.

**32.** අපි යැපුම් මානසිකත්වයෙන් බැහැර වෙමු. අපි නිවහල් රටක් බිහිකරමු.
(1) අපි යැපුම් මානසිකත්වය නිසා නිවහල් රටක් බිහිකරමු.
(2) අපි යැපුම් මානසිකත්වයෙන් බැහැර වීම නිසා නිවහල් රටක් බිහිකරමු.
(3) අපි යැපුම් මානසිකත්වය බැහැර කරද්දී නිවහල් රටක් බිහිකරමු.
(4) අපි යැපුම් මානසිකත්වයෙන් බැහැර වී නිවහල් රටක් බිහිකරමු.

- අංක **33** සහ **34** ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු උත්තරය** තෝරන්න.
**33, 34** ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு **மிகவும் பொருத்தமான சொல்லைத்** தெரிவுசெய்க.
Select the **most suitable answer** to fill in each blank in questions No. **33** and **34.**

**33.** බොහෝ රටවල ඇති අධිවේගී මාර්ග, ගුවන් පාලම් හා ........................... යුක්ත ය.
(1) උමං මාර්ගයට (2) උමං මාර්ගවලින් (3) උමං මාර්ගවලට (4) උමං මාර්ගයෙහි

**34.** ක්‍රීඩාභාර ගුරුතුමා ශබ්ද විකාශන ........................................ මීළඟ තරගය නිවේදය කළේ ය.
(1) යන්ත්‍රයෙන් (2) යන්ත්‍රය (3) යන්ත්‍රයෙහි (4) යන්ත්‍රයට

- අංක **35** ප්‍රශ්නයේ **තද කළු පැහැයෙන් මුද්‍රිත** සංඛ්‍යාව නිවැරදි ව අකුරෙන් ලියා ඇති පිළිතුර තෝරන්න.
**35** ஆம் வினாவில் **தடித்த எழுத்திலுள்ள** எண் சரியான எழுத்துகளால் எழுதப்பட்டுள்ள விடையைத் தெரிவுசெய்க.
Select the answer in which the number in **bold print has been correctly written in letters in question No. 35.**

**35.** එක් රාක්ක පේළියක පොත් **9375** ක් අසුරා තිබුණි.
(1) නවසිය තුන්සිය හැත්තෑ පහක්
(2) අනූ තුන්සිය දහස් හැත්තෑ පහක්
(3) අනූ තුන්සිය හැත්තෑ පහක්
(4) නවදහස් තුන්සිය හැත්තෑ පහක්

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ **ව්‍යාකරණානුකූල ව** නිවැරදි වාක්‍යය තෝරන්න.
**36** தொடக்கம் **40** வரையான ஒவ்வொரு வினாவிலும் **இலக்கணரீதியாக** சரியான வாக்கியத்தைத் தெரிவு செய்க.
Select the **grammatically** correct sentence in each question from No. **36** to **40.**

**36.** (1) සංචාරකයන් යාල අභය භූමියේ සිරි නරඹන අයුරු ළමයින් බලා සිටියහ.
(2) සංචාරකයන් යාල අභය භූමියේ සිරි නරඹන අයුරු ළමයි බලා සිටියහ.
(3) සංචාරකයෝ යාල අභය භූමියේ සිරි නරඹන අයුරු ළමයින් බලා සිටියෝ ය.
(4) සංචාරකයෝ යාල අභය භූමියේ සිරි නරඹන අයුරු ළමයි බලා සිටියේ ය.

**37.** (1) වළිකුකුළෝ නිදහසේ ඉන්නවා මා දැක්කෙමි.
(2) වළිකුකුළන් නිදහසේ ඉන්නවා මම දැක්කෙමි.
(3) වළිකුකුළන් නිදහසේ ඉන්නවා මා දැක්කෙමි.
(4) වළිකුකුළෝ නිදහසේ ඉන්නවා මම දැක්කෙමි.

**38.** (1) විදුහල්පතිතුමා විසින් පදක්කම් පැළඳවීමේ නිල උත්සවය පවත්වන ලදහ.
(2) විදුහල්පතිතුමා විසින් පදක්කම් පැළඳවීමේ නිල උත්සවය පවත්වනු ලැබුවෝ ය.
(3) විදුහල්පතිතුමා විසින් පදක්කම් පැළඳවීමේ නිල උත්සවය පවත්වන ලදි.
(4) විදුහල්පතිතුමා විසින් පදක්කම් පැළඳවීමේ නිල උත්සවය පවත්වනු ලැබූහ.

**39.** (1) පාසලේ පැවැති ශ්‍රමදානයට මිනිස්සු බොහෝ දෙනෙකු පැමිණියහ.
(2) පාසලේ පැවැති ශ්‍රමදානයට මිනිසුන් බොහෝ දෙනෙක් පැමිණියහ.
(3) පාසලේ පැවැති ශ්‍රමදානයට මිනිස්සු බොහෝ දෙනෙක් පැමිණියහ.
(4) පාසලේ පැවැති ශ්‍රමදානයට මිනිසුන් බොහෝ දෙනෙකු පැමිණියහ.

**40.** (1) අප සෙල්ලම් කරද්දී ගුරුතුමා පන්තියට පැමිණියේ ය.
(2) අපි සෙල්ලම් කරද්දී ගුරුතුමා පන්තියට පැමිණියහ.
(3) අපි සෙල්ලම් කරද්දී ගුරුතුමා පන්තියට පැමිණියෙමු.
(4) අප සෙල්ලම් කරද්දී ගුරුතුමා පන්තියට පැමිණියෝ ය.

[ 5 වැනි පිටුව බලන්න / பக். 5 ஐப் பார்க்க / *see page five*

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**64 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| දෙවන බස - සිංහල | I, II |
| இரண்டாம் மொழி - சிங்களம் | I, II |
| Second Language - Sinhala | I, II |

**දෙවන බස - සිංහල II** **இரண்டாம் மொழி - சிங்களம் II** **Second Language - Sinhala II**

- **I** කොටසේ අංක **1** හා **2** ප්‍රශ්න ඇතුළුව **II** කොටසින් **එක්** ප්‍රශ්නයක් ද **III** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් උත්තර ලියන්න.

  பகுதி **I** இல் **1** ஆம் **2** ஆம் வினாக்கள் உட்பட பகுதி **II** இல் ஒரு வினாவையும் பகுதி **III** இல் இரு வினாக்களையும் தெரிவுசெய்து எல்லாமாக **ஐந்து** வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.

  Answer only **five** questions including questions **1** and **2** in Part **I** and selecting **one** question from Part **II** and **two** questions from Part **III**.

## I කොටස / பகுதி I / Part I

**1.** දී ඇති මාර්ගෝපදේශ ඇසුරු කර ගෙන පහත දක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන **වචන 100**ක පමණ රචනයක් ලියන්න.
பின்வரும் தலைப்புகளுள் **ஒன்றைத்** தெரிவுசெய்து அதன் கீழே தரப்பட்டுள்ள விடயங்களை அடிப்படையாகக் கொண்டு ஏறத்தாழ **100** சொற்களில் அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.
Write an essay of approximately **100 words** on **one** of the following topics using the given guidelines.

(අ) පාසලේ පැවැත්වූ අධ්‍යාපන ප්‍රදර්ශනය
- (i) හැඳින්වීම
- (ii) අධ්‍යාපන ප්‍රදර්ශනය පැවැත්වීමේ අරමුණු
- (iii) එය සංවිධානය කළ ආකාරය
- (iv) ප්‍රදර්ශනය පැවැත්වීමෙන් ලද අත්දැකීම්
- (v) සමාලෝචනය

(ආ) ව්‍යායාම කිරීමේ වැදගත්කම
- (i) හැඳින්වීම
- (ii) ව්‍යායාම කිරීමේ අවශ්‍යතාව
- (iii) එයින් ලැබෙන ප්‍රයෝජන
- (iv) තමන්ට ගැළපෙන ව්‍යායාම තෝරා ගන්නා ආකාරය
- (v) සමාලෝචනය

(ඉ) රෝගීන්ට උදවු කිරීමට ලැබුණු අවස්ථාවක්
- (i) හැඳින්වීම
- (ii) රෝගී වීමට බලපාන හේතු
- (iii) රෝගීන්ට පිළිසරණ වූ ආකාරය
- (iv) ඔවුන්ට උදවු කිරීමෙන් ලැබුණු සතුට
- (v) සමාලෝචනය

(ඊ) දුම්රියෙන් ගිය ගමනක්
- (i) හැඳින්වීම
- (ii) ගමන සංවිධානය කළ අයුරු
- (iii) සහභාගි වූ අය පිළිබඳ විස්තර
- (iv) ලබා ගත් සතුට හා විනෝද වූ ආකාරය
- (v) සමාලෝචනය

(උ) විදුලිය පිරිමැසීමේ අවශ්‍යතාව
- (i) හැඳින්වීම
- (ii) විදුලිය භාවිත කරන අවස්ථා
- (iii) පිරිමසා ගැනීමේ ක්‍රම
- (iv) පිරිමැසීමෙන් ලැබෙන ප්‍රයෝජන
- (v) සමාලෝචනය

[ 6 වැනි පිටුව බලන්න / பக். 6 ஐப் பார்க்க / *see page six*

**2.** දී ඇති පින්තූරය බලා, ඒ ඇසුරෙන් අර්ථවත් වාක්‍ය **පහක්** ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන **හතරක්වත්** තිබිය යුතු ය.)
தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள **ஐந்து** வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்தபட்சம் **நான்கு** சொற்களாவது இருத்தல் வேண்டும்.)
Compose **five** meaningful sentences with reference to the given picture.
(There should be at least **four** words in a sentence).



## II කොටස / பகுதி II / Part II

- අංක **3** හා **4** යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර සපයන්න.
  **3** ஆம் **4** ஆம் வினாக்களுள் ஏதேனும் **ஒரு** வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
  Answer only **one** question from questions No. **3** and **4**.

**3.** පහත සඳහන් කවි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் கவிதையை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following poem and answer the questions given.

සුපිපි මල් ගොමුවේ
මල් බමරුන්ට පියවේ
හොඳ ළමයා ලොවේ
හැමෝට ම ඒ වගේ පියවේ

නොකිපෙන ඉක්මනට
නිතරම සිනා මුසු කට
පෙන්වන කෙළි කවට
පුරුදු ළමයා සැපකි දැකුමට

පොතපතට හිත දෙන
දෙගුරුන් බසට හික්මෙන
හොඳ ළමයා වසන
ගෙදර සුරවිමනක් ය බබළන

කවදා නමුත් මම
පැමිණෙමි දියුණු මගට ම
හොඳ ළමයා මෙහෙම
සිතාලා වැඩ කරයි නිතර ම

(i) හොඳ ළමයා අන් අයට ප්‍රිය වන්නේ කවර ලෙසින් ද?
(ii) මේ ළමයා සතු හොඳ ගතිලක්ෂණයක් ලියන්න.
(iii) හොඳ ළමයා වසන ගෙදර සුරවිමනක් වීමට හේතුවක් ලියන්න.
(iv) මෙහි සඳහන් ළමයා වැඩ කරන්නේ කවර අරමුණකින් ද?
(v) 'දෙමවුපියන්' යන්නට සමානාර්ථ පදයක් කවි පෙළෙන් උපුටා ලියන්න.

[ 7 වැනි පිටුව බලන්න / பக். 7 ஐப் பார்க்க / *see page seven*

Downloaded from 'Past Papers Wiki' - Web: www.pastpapers.wiki

4. පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following paragraph and answer the given questions.

කල්පනාවේ නිරත වෙමින් ම මිලින්ද මිරිසවැටිය චෛත්‍යය අසලට ම පැමිණියේ ය. තමා පසුකොට ගිය වන්දනා බස්වල පැමිණ සිටියේ පාසල් ශිෂ්‍යාවන් පිරිසක් බව ඔහුට පෙනුණි. මිරිසවැටිය නරඹමින් සිටි ශිෂ්‍යාවෝ තම ගුරුවරුන් සමග චෛත්‍යය වටා ගමන් කළහ. ඇතමෙක් ඡායාරූප ගනිමින් ද තවත් සමහරෙක් මින් පෙර නොදුටු මේ ආශ්චර්යවත් බිමේ මහිමය ගැන කතිකා කරමින් ද සිටියහ. හුදෙකලාව ඔබ මොබ ගමන් කරන මිලින්දට මිරිසවැටිය චෛත්‍යයට යාබද බුදුමැදුර අසල වන්දනා පොත් තබා ගෙන විකුණන සෙනරත් මාමා දක්නට ලැබුණි. හදිසියේ ම එතනට පැමිණි ශිෂ්‍යාවන් සෙනරත් මාමාගෙන් පින්තූර පොත් මිල දී ගන්නා ආකාරය මිලින්ද බලා සිටියේ ය. කුඩා පොත් මේසයට නුදුරෙන් වූ විහාර බිත්ති කණ්ඩිය මත තමාගේ අත තිබූ කැමරාව තැබූ එක් ශිෂ්‍යාවක් පින්තූර පොත් කිහිපයක් ම මිල දී ගත්තා ය. සෙනරත් මාමා පින්තූර පොත්වල ඇති දේවල් ගැන ශිෂ්‍යාවන්ට පැහැදිලි කරන්නට පටන් ගත්තේ ය. මද වේලාවකින් පොත් සියල්ල විකිණී අවසන් වූ අතර ශිෂ්‍යාවෝ ද එතනින් පිටත් ව ගියෝ ය.

(i) මෙම ඡේදයේ සඳහන් වන චෛත්‍යයේ නම කුමක් ද?
(ii) චෛත්‍යය වටා ගමන් කළෝ කවරහු ද?
(iii) මෙහි සඳහන් සෙනරත් මාමාගේ රැකියාව කුමක් ද?
(iv) පොත් මිල දී ගැනීමට පැමිණි ශිෂ්‍යාවක තම කැමරාව තැබුවේ කොහි ද?
(v) 'තනිව ම' යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් උපුටා ලියන්න.

## III කොටස / பகுதி III / Part III

- අංක **5** හා **6** යන ප්‍රශ්න **දෙකට ම** උත්තර සපයන්න.
**5, 6** ஆகிய **இரண்டு** வினாக்களுக்கும் விடை எழுதுக.
Answer **both** questions No. **5** and **6**.

5. පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.
பின்வரும் விடயங்களைக் கருத்திற்கொண்டு அறிவித்தலொன்றை தயாரிக்குக.
Prepare a notice based on the following information.

ඔබ ජීවත් වන පස්දුන්ගම, අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම ජීවනෝපාය කර ගත් බොහෝ පිරිසක් වාසය කරන ගමකි. නමුත් තම නිෂ්පාදන නිසි මිලකට විකුණා ගැනීමට අවස්ථාව නොලැබීම නිසා ගැමියෝ මහත් කනස්සල්ලට පත්ව සිටිති. මෙයට පිළියමක් ලෙස ග්‍රාම සංවර්ධන සමිතිය නව වැඩපිළිවෙළක් හඳුන්වා දීමට අපේක්ෂා කරයි. මේ යටතේ පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත.

- භාණ්ඩ නව මුහුණුවරකින් නිෂ්පාදනය කිරීම
- ආසන්න නගරයේ සහ ඉන් බැහැර ව භාණ්ඩ විකිණීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම

මෙම කරුණු ඇතුළත් කරමින් ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.
(ඔබ පස්දුන්ගම ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් නඳුන් ප්‍රියශාන්ත ගමගේ යැයි සිතන්න.)

**නැතහොත්**
**அல்லது**
**Or**

පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත යැවීමට සුදුසු රාජකාරි ලිපියක් ලියන්න.
பின்வரும் விடயங்களைக் கருத்திற்கொண்டு பொலிஸ் நிலைய பொறுப்பதிகாரிக்கு அனுப்புவதற்குப் பொருத்தமான உத்தியோகபூர்வ கடிதமொன்றை எழுதுக.
Based on the following infortmation write an official letter to be sent to officer-in-charge of the police station.

විජිතපුර මහා විද්‍යාලයේ ශිෂ්‍යයන් 1500ක් පමණ අධ්‍යාපනය හදාරන අතර පස්දුන්ගම හා ඒ අවට ගම්වලින් මෙම පාසලට ශිෂ්‍යයෝ බොහෝ දෙනෙක් බස්රථවලින් පැමිණෙති. උදෑසන පවතින මාර්ග තදබදය නිසා අනතුරු කිහිපයක් වාර්තා වී ඇති බැවින් පාසල් සංවර්ධන සමිතියේ අවධානය පහත කරුණු කෙරෙහි යොමු වී ඇත.

- අනතුරු වළක්වා ගැනීම සම්බන්ධයෙන් ශිෂ්‍යයන් දැනුවත් කිරීමේ අවශ්‍යතාව
- ඒ සඳහා එළඹෙන 25 වන දින පාසලේ ප්‍රධාන ශාලාවේ දී රැස්වීමක් පැවැත්වීමට අපේක්ෂා කිරීම

මෙම රැස්වීමේ දී ශිෂ්‍යයන් දැනුවත් කිරීම සඳහා පොලිස් නිලධාරියකුගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලමින් විජිතපුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත යැවීම සඳහා සුදුසු ලිපියක් සකස් කරන්න.
(ඔබ පාසල් සංවර්ධන සමිතියේ ලේකම් නදනි පුංචිහේවා යැයි සිතන්න.)

[ 8 වැනි පිටුව බලන්න / பக். 8 ஐப் பார்க்க / *see page eight*

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!

6. පහත දැක්වෙන දෙමළ / ඉංග්‍රීසි වාක්‍ය **සිංහලට** පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் / ஆங்கில வாக்கியங்களை **சிங்களத்தில்** மொழிபெயர்க்க.
Translate the following Tamil / English sentences into **Sinhala**.

(i) நாங்கள் பாடசாலையைச் சுற்றி சுத்தப்படுத்தினோம்.
We cleaned around the school.

(ii) அம்மாவும் மகனும் சந்தைக்குச் சென்றனர்.
Mother and son went to the fair.

(iii) பாட்டி எங்களுக்கு சுவையான உணவு சமைக்கின்றாள்.
Grandmother cooks us delicious food.

(iv) நாம் நூலகத்தில் அமைதியாக இருக்க வேண்டும்.
We should be silent in the library.

(v) அவர் சித்திரப் போட்டியில் வெற்றிபெற்றாள்.
She won the art competition.

**නැතහොත්**
**அல்லது**
**Or**

පහත සඳහන් තොරතුරු පදනම් කර ගෙන සංවාදයක් ලියන්න. (වාක්‍ය **10ක්** ප්‍රමාණවත් වේ.)
பின்வரும் தகவல்களை அடிப்படையாகக் கொண்டு உரையாடல் ஒன்று எழுதுக. (**10** வாக்கியங்கள் போதுமானவை.)
Write a dialogue based on the following information. (**10** sentences are enough.)

එළවළු ප්‍රවාහනය කරන්නන් සඳහා නව වැඩපිළිවෙළක් හඳුන්වා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇති බව ඔබට දැන ගන්නට ලැබෙයි. ඒ සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමට ඔබට අවශ්‍ය ව ඇති බැවින් අදාළ නිලධාරියකු සමග කරන සංවාදය ලියන්න.

- නිලධාරියා මුණගැසීම හා සුබ පැතීම
- අදාළ කරුණු සම්බන්ධයෙන් තොරතුරු විමසීම
- සමුගැනීම

❊ ❊ ❊

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO
www.LOL.LK

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න